දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2694860
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

මගේ අංකය )
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )
Date

මගේ අංකය :PA/EOH/FCAU/05/2008

දිනය :2011.08. 24

සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්,
මහනගරසභා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිවරුන්
අධ්‍යක්ෂ/ජාතික සෞඛ්‍ය විද්‍යායතනය වෙත,

**විධාන අංකः 2011/11**

2005 ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) රෙගුලාසි යටතේ නඩු පැවරීම

1980 අංක 26 දරන ආහාර පනත යටතේ උක්ත රෙගුලාසිය ප්‍රකාරව පනවා ඇති නඩු සම්බන්ධව සමහර අවස්ථාවලදී ගරු අධිකරණ වල ගැටළුකාරී තත්වයන් පැන නැගී ඇතිබවට අනාවරණය වී ඇත.

විශේෂයෙන්ම පොදු නාමය භාෂා දෙකකින් සඳහන් කිරීමේදී ඉංග්‍රීසි භාෂාවෙන් යොදා ඇති පොදු නාමය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමේදී නිශ්චිත පරිවර්තනයක් ලබාදීම අපහසු අවස්ථාවල පොදු නාමය පිළිබඳව ඇතිවන මතභේදකාරී තත්වයන් පිළිබඳ තොරතුරු මෙම කාර්යාලයට නිරන්තරයෙන් ලැබෙමින් පවතී.

මේ පිළිබඳව එක් මහේස්ත්‍රාත් අධිකරණයකින් දී ඇති අතුරු නියෝගයක් පරිදි "ආහාර ලේබල් පිළිබඳව සිදුකරනු ලබන වැරදි නතරකිරීමේ හැකියාව ප්‍රධාන ආහාර බළධරයා සතුවන බැවින් ඒ අනුව ආහාර (සංශෝධන) පනතේ 3 (2) වගන්තිය ප්‍රකාර කටයුතු කිරීම සඳහා ප්‍රධාන ආහාර බලධරයාගේ අවධානය පිණිස යොමු කරන ලෙසට " නියම කර ඇත.

මේ ආකාරයෙන් කටයුතු කිරීමේදී ආහාර පනතේ බලයලත් නිළධාරීන් මෙන්ම අමාත්‍යංශයද අපහසුතාවයට පත්වන හෙයින් මෙම තත්වය වලක්වාගැනීම සඳහා පොදු නාමය පිළිබඳව සහ වෙනත් ලේබල් සම්බන්ධව මතභේදයට තුඩුදිය හැකි කරුණු පිළිබඳව ප්‍රධාන ආහාර බළධරයා වෙත පහත දැක්වෙන ලිපිනය මගින් දැනුම්දී අවශ්‍ය උපදෙස් ලබාගැනීමෙන් පසු නඩු පැවරීමේ කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

ලිපිනය : අධ්‍යක්ෂ/පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
අංක 385
පූජ්‍ය බද්දෙගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

වෛද්‍ය යූ.ඒ.මෙන්ඩිස්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
(ප්‍රධාන ආහාර බලධරයා)